28

# දේශ හිතෛෂී මුස්ලිම්වරු

ආදරණීය ශිෂ්‍ය ශිෂ්‍යාවනි, දරුවෙකු තමා බිහි කළ මවට අසීමිත ආදරයක්, සෙනෙහසක් දක්වීම ස්වාභාවික ය. ඔහු සෑම විට ම තම මව සමග ගෞරවාන්විත ව, හා කීකරු ව හැසිරෙයි. එසේ ම මිනිසා තමා ඉපදුණු රටට ඇලුම් කළ යුතුවේ. මව්බිම යනුවෙන් අමතනු ලබන්නේ ඒ නිසයි. මවට මෙන් ම මව් රට කෙරෙහි ද ඇල්මක් බැඳීමක් දක්විය යුතු ය යන්න මෙහි බලාපොරොත්තුවයි. තම රට වෙනුවෙන් තම ජීවිතය කැපකළ පරිත්‍යාගශීලී කාන්තාවකගේ කතාවක් පහතින් දැක්වේ.

අවුරුදු 300කට පමණ පෙර මහනුවර රාජධානියේ දෙවන රාජසිංහ නැමැති රජතුමෙක් රට පාලනය කළේ ය. ඔහුගේ කාලයේ ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ පෘතුගීසීහු පාලනය කළෝ ය. ඔවුහු යුරෝපයේ සිට පැමිණියහ. ඔවුන් හා රාජසිංහ රජු අතර සටන් ඇවිලිණි. එම සටනෙන් පරාජය වූ රජතුමා පළා ගොස් සැඟවුණේ ය. එය දනගත් පෘතුගීසි සේනාව ඔහු සොයා ගියෝ ය. රජතුමා ඌව පළාතේ ඇති පංගරගම්මන නැමැති



ගම්මානයට පැමිණියේ ය. එහි තිබුණු විශාල කොස් ගසක් දක්කේ ය. එහි එක් මිනිසකුට ඇතුළුවිය හැකි පරිදි තිබූ විශාල බෙනයක් තිබුණි. එහි රිංගා ගත් රජු සැඟැවුණේ ය. එම කොස් ගස ආසන්නයේ එක් ගව ගාලක් තිබුණි. මුස්ලිම් කාන්තාවක් එළදෙනෙකුගෙන් කිරි දොවමින් සිටියා ය. ඇය රජතුමා ගස් බෙනයේ සැඟවෙනු දුටුවා ය.

ටික වේලාවක දී රජු පසුපස පන්නාගෙන ආ පෘතුගීසි භටයෝ එතැනට පැමිණියෝ ය. රජු සැණෙකින් අතුරුදන් වීම පිළිබඳ ව කෝපාවිෂ්ට වූහ. ඔබ මොබ සෙවූ ඔවුහු අසල කිරි දොවමින් සිටි මුස්ලිම් කාන්තාව දුටුවෝ ය. ඔවුන් ඇය සමීපයට විත් මෙතැනට පැමිණි රාජසිංහ රජු කොහේ ද යනුවෙන් තර්ජනාත්මක ව විමසුවෝ ය.

ඇය බයෙන් වෙවුලන්නට වූවා ය. පැලඳ සිටි සළුවෙන් සිරුර වසා ගන්නට වූ ඇයගෙන් පෘතුගීසි භටයින් නැවතත් තර්ජනාත්මකව විමසුවෝ ය. දුටු බව පවසා රජු පාවා දීමට හෝ නොදුටු බවට බොරු කීමට හෝ ඇය කැමති නොවූවා ය. ඇය නිහඬ ව සිටියා ය. රජු සැඟවී සිටි ස්ථානය ඔවුන්ට සොයාගත නොහැකි විය. පෘතුගීසි භටයන්ගේ මහත් කෝපය ඉහ වහා ගියේ ය. ඉවසීම ඉක්මවා ගිය ඔවුහු අමානුෂික ලෙස ඇය කපා කොටා මරා දැමූහ.

පෘතුගීසි භටයන් එතැනින් නික්ම ගිය පසු රාජසිංහ රජු එළියට පැමිණියේ ය. ලේ විලක් මධ්‍යයේ සිටි එම මුස්ලිම් කාන්තාව දැක විමතියෙන් ඔහු ගල් ගැසුණේය. මා වෙනුවෙන් මැය තම ප්‍රාණය පිදුවා ය, යනුවෙන් දැඩි ශෝකයට පත්විය. ඇය කළ ජීවිත පරිත්‍යාගය දැක මා රැක්ක ලේ, යනුවෙන් පැවසුවේ ය. එම කාන්තාව කළ පරිත්‍යාගය ඔහුට අමතක කරන්නට නොහැකි විය. ටික කාලයකට පසු රාජසිංහ නැවතත් රජ විය. ඇය අනුස්මරණය කිරීම වෙනුවෙන් පංගරගම්මන යන ගම්මානය ඇයගේ ඥාතීන්ට තෑගි කළේ ය.

ආදරණීය දරුවනේ, මෙම ඉතිහාස කතාව දෙස බලන්න. මෙය අසන විට ඇඟ කිළිපොලා යනවා නේද? තම රටේ පාලකයන් විදේශ ආක්‍රමණිකයින්ගෙන් ආරක්ෂා කිරීම පිණිස මුස්ලිම් කාන්තාවක් කළ පරිත්‍යාගයත් දේශහිතෛෂී බවත් දුටුවා ද? රාජ්‍ය පාලකයන් කෙරෙහි දැක්වූ විශ්වාසය ඇය මෙවැනි පරිත්‍යාගයක් කිරීමට පොළඹවන්නට ඇත.

මිනිසකු තම ජාතිය, භාෂාව, සමාජය, තමා ජීවත් වන භූමිය, රට ආදිය කෙරෙහි ඇලුම් කිරීම ඉස්ලාම් අගය කරන්නේ ය. මනුෂ්‍ය ස්වභාවයට සරිලන පරිදි ඉස්ලාමයේ සෑම වගකීමක් හා කාර්යයක් ම පිළිවෙළකට සකසා ඇත.

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් තමා ඉපදුණු මක්කා නගරයටත්, ඉස්ලාමීය සමාජය බිහි කළ මදීනා නගරයටත් සැම විට ම ඇලුම් කරන්නෙකු ව සිටියේ ය. මක්කාව හැර මදීනාවට පිටත් ව යනවිට (හිජ්රත්) මක්කාව දෙස බලා දුකින් මෙසේ පැවසුවේ ය.

"මේ පොළොවෙහි ඇති නගර අතරින් ඔබ මා කැමති ම නගරයයි. සත්‍ය වශයෙන් ම මගේ ජනයා මා පිටත් නො කළේ නම් ඔබ නො වන ගමක මම වාසය නො කරමි" (තිරිමිදි)

මක්කාවේ සිට එය අතහැර මදීනාවට පැමිණි නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ සෑම විට ම තමා ඉපදුණු ගම පිළිබඳ ව දුකින් පසුවූහ. නමුත් කාලය ගතවීමත් සමඟ මදීනා පිළිබඳ ආදරය ද එතුමන්ගේ සිතෙහි හටගත්තේ ය. තමාහට මදීනාව පිළිබඳ ඇල්මක් ඇති කරන ලෙස අල්ලාහ්ගෙන් පහත පරිදි ප්‍රාර්ථනා කළෝ ය.

යා අල්ලාහ්, මා හට මක්කාව කෙරෙහි කෙතරම් ආදරයක් ඇත්තේ ද එසේ ම මදීනාව කෙරෙහිත් ඇති කරත්වා.! නැතහොත් එයට වඩා වැඩි ආදරයක් ඇති කරත්වා.! (බුහාරි)

තව ද නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් බිලාල් අල් හබෂි රළියල්ලාහු අන්හු, සල්මාන් අල් ෆාරිසි රළියල්ලාහු අන්හු, සුහෙයිබ් අර්රූමි රළියල්ලාහු අන්හු, හුදෙයිෆතුල් යමානි රළියල්ලාහු අන්හු වැනි වෙනත් රටවල සිට ඉස්ලාමය වැලඳ ගත් නබි මිත්‍රයන්ට ඔවුන්ගේ රටවල නම් සමඟ ම ඇමතීමෙන් නබි තුමාණන් රට පිළිබඳ ඇල්මෙන් ජීවත් විය යුතු ය යන්න අපට උගන්වනවා නොවේ ද?

ආදරණීය සිසු දරුවනි, සත්‍ය දේශ හිතෛෂි බව යනු රටෙහි සිතියම් හෝ භූගෝලීය සැකැස්මට ආදරය කිරීම පමණක් නො ව එම රටෙහි පුරවැසියන්ට ආදරය කිරීම වන්නේ ය. රටෙහි ජනතාවගේ යහපත පණිස තමාට හැකි පරිදි සේවාවන් ඉටු කිරීම, ඔවුන් හා සහජීවනයෙන් ජීවත් වීම, ඔවුන් වෙනුවෙන් ශ්‍රමය කැප කිරීම ආදිය සත්‍ය වූ දේශ හිතෛෂී බවේ සලකුණු වේ.

රටෙහි නිදහස, ආරක්ෂාව, සංවර්ධනය, අධ්‍යාපනය, නිරෝගිකම, සහජීවනය ආදියෙහි වර්ධනයට ආත්මාර්ථකාමිත්වයෙන් තොර ව වෙහෙසීම

වැදගත් වේ. රට අනතුරකට හෝ දුගී බවට හෝ දරිද්‍රතාවට හෝ නාස්තියට හෝ ලක් වීමේ දී රට මුහුණ දෙන ගැටලු විසඳීමට උත්සාහ කිරීමත් දේශ හිතෛෂී බවේ සලකුණකි.

දේශයේ යහපත වෙනුවෙන් මෙරට මුස්ලිම්වරුන් සේවය කළා ය, යන්න ඉතිහාසය මගින් දැනගත හැකි වේ. රටෙහි නිදහස වෙනුවෙන් මුස්ලිම්වරුන් වෙහෙස වී ඇත. සිංහල රජවරුන් සමඟ එක් වී රටෙහි යහපත වෙනුවෙන් මුස්ලිම් ප්‍රජාව සේවය කර ඇත. මන්ත්‍රීවරුන් ලෙසත්, ප්‍රධානීන් ලෙසත්, විදේශික දූතවරුන් ලෙසත්, වෛද්‍යවරුන් ලෙසත්, රජමාළිගාවල සූපවේදීන් ලෙසත්, කටයුතු කර රජවරුන්ගේ ගරු බුහුමන් ලබාගත් ඉතිහාසගත සිද්ධීන්, ඉතිහාසය හා සාහිත්‍ය මූලාශ්‍රයවල සනිටුහන් වී ඇත.

තව ද අප රටෙහි මුස්ලිම්වරුන් තමන්ට හැකි අයුරින් රටේ යහපත වෙනුවෙන් කටයුතු කරන බව ද සඳහන් කළ යුතුයි.

**අභ්‍යාසය**

1. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ හිජ්රතය සඳහා පිටත්වන විට මක්කා නගරය දෙස බලා කුමක් පැවසුවෝ ද?
2. රටේ නාමය සමඟ තම නම එක්කර සඳහන් කරන සහබාවරු තිදෙනෙකු නම් කරන්න.

**ක්‍රියාකාරකම්**

1. දේශප්‍රේමය යන මාතෘකාව යටතේ පාසල් සඟරාවට ලිපියක් නිර්මාණය කරන්න.